Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019-12-12

පැමිණිලිකරුවන් : ඩී.එන්.ආර්.නන්දසිරි මයා.
145/2/ජේ.
ගෝනහේන. කඩවත.

වගඋත්තරකරුවන් : 01 පො.ප.ගැමුණු ගුණරත්න මයා.
පොලිස් ස්ථානය.
කඩවත.

02 සහකාර පොලිස් අධිකාරී ඩී.එස්. වික්‍රමසිංහ මයා.
පොලිස් අධිකාරි කාර්යාලය.
පානදුර.

03. ශ්‍රීලාල් ජයසුන්දර මයා.
හිටපු ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
කඩවත.

04. උ.පො.ප.ජයතිස්ස මයා.
පාලන අංශය.
පොලිස් ස්ථානය.
පෑලියගොඩ.

**පැමිණිලි අංක : HRC/2750/14**

පැමිණිල්ලේ කරුණු සැලකිරීම :-

01. පැමිණිලිකරු විසින් පර්චස් 10ක ඉඩමක් මුදල් ගෙවා ලබා ගෙන ඇත. පසු කාලීනව තවත් පුද්ගලික පාර්ශවයක් ඉහත සදහන් කළ ඉඩමේ හිමිකාරිත්වය ඉල්ලා ඇත. ඉහත ඉඩමේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Phone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඔප්පුව සකස්කළ නීතිඥවරිය වන දමයන්ති කුමාරි යන අය පැමිණිලිකරුට පවසා ඇත්තේ. ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගත හැකි බැවින් පොලිසියට ඒ පිළිබඳව පැමිණිලි නොකරන ලෙසයි.

02. ගැටළුව නිරාකරණය නොවූ බැවින් පැමිණිලිකරු විසින් ප්‍රතිවිරුද්ධ ඔප්පු හිමිකාරිය වන ඩබ්. කමලාවති සහ මුල් හිමිකාරිය වන රේණුකා ප්‍රියංගනි යන පාර්ශවයට එරෙහිව පොලිස් පැමිණිල්ලක් සිදුකර ඇත.

03. ඉහත පැමිණිල්ල හේතුවෙන් කුපිතවූ නීතිඥවරිය පැමිණිලිකරු තමාට දුරකථනයෙන් අමතා අපහාස කළ බවට පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇත. රාගම රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වන නීතිඥවරියගේ සැමියාද තවත් පැමිණිල්ලක් ගොනු කර පැමිණිලිකරුට තර්ජණය කර ඇත.

04. තමා පොලිසියට කළ පැමිණිල්ලෙන් සහනයක් නොලැබුණු බැවින් පැමිණිලිකරු පෑලියගොඩ වංචා විමර්ශන ඒකකයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

05. 2014.05.10 වන දින පැමිණිලිකරු විසින් පොලිසිය සමග රේණුකා ප්‍රියංගනි නැමැත්තිය අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදි දුරකථන ඇමතුම් ලබා ගන්නා වෙළඳ සැලක (Communication shop) නතර වී ඇත. එහිදි නීතිඥවරියගේ සැමියා වන වෛද්‍ය ප්‍රනාන්දු ය නඅය පැමිණිලිකරුට බැණ වැදි තර්ජණය කර ඇත.

06. එදිනම පැමිණිලිකරු කඩවත පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදි ඔහුගේ නමට වරෙන්තුවක් ඇති බව පොලිසිය විසින් දැන්වීම නිසා ඔහු අත්අඩංගුවට පත්වී ඇත.

07. පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසු දින 21ක් බන්ධනාගාරගත කොට ඇත.

වගඋත්තරකරුගේ කරුණු සැලකිරිම =:

තුන්වන වගඋත්තරකරු 2014.09.09 දරණ වාර්තාව මගින් මෙසේ ප්‍රකාශ කර සිටි.

01. මෙම සිදුවීම පැමිණිලිකරු සහ නීතිඥ එන්.ජී.ඩී. දමයන්ති අතර ඉඩමක් විකිණීම සම්බන්ධයෙන් ඇතිවූ ආරවුලකි.

02. පැමිණිලිකරු විසින් නිතිඥවරියට දුරකථනයෙන් බැණවැදී ඇත්තේ, පැමිණිලිකරු විසින් සැකසීමට උපදෙස් ලබා දුන් ඔප්පුව ඒ වන විටත් වෙනත් අයකුගේ නමට ලියාපදිංචි වී තිබීම හේතුවෙනි.

03. එදිනම ප.ව.3.00ට ආසන්න වේලාවක පැමිණිලිකරු විසින් මහර නිතිඥ සංකීර්ණයේ නිතිඥවරියගේ කාර්යාලයට ගොස් ඇයට උස්හඬින් බැණවැදී අපහාස සිදුකර ඇත.

04. 2013.12.11 දින නිතිඥවරිය විසින් කඩවත පොලිස් ස්ථානයට මේ පිළිබඳව පැමිණිලි කර ඇත. ඇයගේ ප්‍රකාශය සි.අයි.බි (II) 264/223 යටතේ වාර්තා කර ඇති අතර, එම්.සි.ආර්/2013 යටතේ ලියාපදිංචිය කර ඇත.

05. දුරකථන ඇමතුම සම්බන්ධ ආරවුල බී7056/13 යටතේ මහර මහෙස්ත්‍රාත් අධිකරණයට වාර්තා කර ඇත.

06. රාගම රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වන ටී.ඩී.සී.ප්‍රනාන්දු සහ බිරිද වන නිතිඥ දමයන්ති යන අය 2014.05.19 දින නිවසේ සිටින අවස්ථාවේදී පැමිණිලිකරුට විරුද්ධව ඇති පැමිණිල්ල ඉල්ලා අස්කර ගන්නා බවට පැමිණිලිකරු විසින් තර්ජණය කර ඇත. වෛද්‍ය ප්‍රනාන්දු යන අය විසින් ඉහත තර්ජණය කිරිම මගින් තමාට බියක් සහ ලැජ්ජාවක් ඇති වූ බවට පැමිණිලි කර ඇත. මෙම ප්‍රකාශය සී.අයි.බී. (II) 159/223 යටතේ වාර්තා කර 1498/2014 යටතේ පැමිණිල්ලක් ලෙස ලියාපදිංචි කර ඇත.

07. බී/227/2014 යටතේ පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන මහර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2014.06.04 බන්ධනාගාර ගත කොට ඇත.

08. පැමිණිලිකරු කඩවත පොලිස් ස්ථානයට කිසිදු පැමිණිල්ලක් සිදුකර නොමැති අතර, ඔහු පෑලියගොඩ වංචා විමර්ශන අංශයට ඉඩම් ආරවුල සම්බන්ධයෙන් පැමිණිලි කර ඇත.

09. බී 2271/2014 සම්බන්ධයෙන් පොලිසිය විසින් නිතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත.

10. තවද බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් කැළණිය දිසාව භාර සහකාර පොලිස් අධිකාරිවරයාට මේ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා පැමිණිලිකරුට එරෙහිව ඇති පැමිණිල්ල ඉවත් කර ගන්නා ලෙස කටයුතු කිරීමට දන්වා ඇත.

11. මෙම සිද්ධිය වන අවස්ථාවේ කඩවත පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ සහකාර පොලිස් අධිකාරි (3 වන වගඋත්තරකරු) 2015.11.09 දින කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී පහත සඳහන් කරුණු ප්‍රකාශ කර ඇත.

(i) 2013.12.11 ඔහු විසින් විමර්ශනයක් පවත්වන ලද අතර, එහිදී හෙළිවී ඇත්තේ, ඉඩම් ආරවුලට සම්බන්ධ දෙපාර්ශවය සතුව ඉඩමේ අයිතියට හිමිකම් ඇති ඔප්පු පවතින බවයි.

(ii) එම නිසා ප්‍රාථමික අධිකරණ විධිවිධාන පනතේ 66 වන වගන්තිය යටතේ අධිකරණයට යොමුකර ඇත.

(iii) ඉන් පසුව දමයන්ති කුමාරි යන අය පැමිණිලිකරු විසින් තමාට දුරකථනය හරහා වාචික අපහරණයක් සිදුකළ බවට පැමිණිලි කර ඇත.

(iv) අදාළ ආරවුල පිළිබඳව විමර්ශනය සිදුකිරීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමට බී 7054/2013 යටතේ ඉල්ලීමක් කර ඇත. මෙම පොලිස් නිලධාරියාට 2014.04.01 දින මාරුවීමක් ලැබී ඇති අතර පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට ඔහු සම්බන්ධ වී නැත.

12. 01 වගඋත්තරකරු ප්‍රකාශ කරන්නේ, පැමිණිල්ල අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ, පුද්ගලික තොරතුරු සන්නිවේදන ආයතනයකින් තොරතුරු ලබා ගැනීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමට වන අතර, පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, අධිකරණය මගින් ලබා දුන් වරෙන්තුවක් මත බවයි.

13. 04 වන වගඋත්තරකරු දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ නොවූ අතර, ඔහු විසින් 2014.05.14 සිට 2014.05.20 අතර කාලය තුළ රාජකාරියට වාර්තා නොකළ බවයි.

**2014.09.12 දිනැති අංක ඒ.එස්.පි/කේ.ඒ.එස්./ඕ.ඩබ්/3428/2014 දරණ කැළණිය දිසා 1 භාර සහකාර පොලිස් අධිකාරිගේ වාර්තාව -:**

01. වෛද්‍ය පී.ඩී.බී. චන්ද්‍ර ප්‍රනාන්දු 2014.08.15 දින අයි.ජී.පී./පී.ජී.සී/0/1024/2014 යටතේ පොලිස්පති සහන මැදිරියට තමාට තර්ජණය කිරීම සහ තම දේපලට බලහත්කාරයෙන් ඇතුල්වීම යන පැමිණිලි නිසි පරිදි විභාගකර නොමැති බවට පැමිණිලි කර ඇත.

02. 2014.05.19 වන දින සි.අයි.බි (II)264/223 යටතේ ඉහත කී වෛද්‍ය ප්‍රනාන්දු ය නඅය පැමිණිලිකරු දේපලට බලහත්කාරයෙන් ඇතුළුවීම සහ තර්ජණය කිරීම සම්බන්ධයෙන් කඩවත පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදුකර ඇත.

03. ඉහත සදහන් කල වෛද්‍ය ප්‍රනාන්දු යන අයගේ බිරිද නිතිඥ දමයන්ති යන අය 2013.02.11 දින සිඅයිබි II 264/223 යටතේ ඩී.එන්. රාජපක්ෂ නන්දසිරි යන අය තමාට දුරකථනය හරහා බැණ තර්ජණය කල බවට පැමිණිල්ලක් ගොනුකර ඇත. මෙම පැමිණිල්ල ප්‍රකාරව එවකට ස්ථානාධිපතිව සිටි 2 වන වගඋත්තරකරු අදාළ ගැටළුව සම්බන්ධයෙන් මහර මහෙස්ත්‍රාත් අධිකරණයට බී/7056/13 යන බී වාර්තාව මගින් කරුණු වාර්තා කිරිමෙන් පසුව දෙපාර්ශවය සමථයකට පත්කර ඇත.

04. සි.අයි.බි. (II) 159/2223 යටතේ ස්ථානාධිපති විසින් ඩී.එන්.ආර්. නන්දසිරි යන අය අත්අඩංගුවට ගෙන 2014.05.20 දින 2271/14 යටතේ අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව දින 14කට බන්ධනාගාර ගත කර ඇත.

05. බී 7056/13 යටතේ නිකුත් කරන ලද සිතාසි ප්‍රකාරව පැමිණිලිකරු අධිකරණයේ පෙනී නොසිටි නිසා 2014.06.03 දින තවත් දින 07ක් බන්ධනාගාර ගත කර ඇත.

06. එම නිසා වෛද්‍ය පී.ඩී.සී.චන්ද්‍රා ප්‍රනාන්දුගේ පැමිණිල්ල කඩවත පොලිස් ස්ථානය මගින් තමාට සිදුවූ තර්ජණය කිරීම සහ තම දේපලට බලහත්කාරයෙන් ඇතුල්වීම නිසි පරිදි විභාග නොකිරීම පදනම් විරහිතය.

07. පැමිණිලිකරු විසින් බස්නාහිර පලාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සිදුකල පැමිණිලි අංක එස්.ඩී.අයි.ක්‍යු./ඩබ්පි/10757/2014 යටතේ කැලණිය දිසා අංක 1 භාර සහකාර පොලිස් අධිකාරි විසින් විමර්ශනයක් පවත්වා ඇත. (නියෝග අංක ඩී.අයි.ක්‍යු/ඩබ්.පි/4කේ/කේ.ජ්.ඩී/15201 සහ පි.ජ්/එස්.එස්.පි/14794/14 යටතේ)

08. සහකාර පොලිස් අධිකාරිගේ විමර්ශනයට අනුව වෛද්‍ය පී.ටී.සි. චන්ද්‍රා ප්‍රනාන්දු යන අය පැමිණිලිකරු යන අයට එරෙහිව කර ඇති තර්ජණය කිරීම සහ දේපලවලට බලහත්කාරයෙන් ඇතුල්වීම යන පැමිණිලි සාවද්‍ය බවට නිරීක්ෂණය කර ඇත.

09. පොලිස් ස්ථානයට ලැබුණු පැමිණිල්ලක් නිසි පරිදි විභාග නොකර පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත්කර දින 14ක් බන්ධනාගාරගත කර කිරීම, අධිකරණයට අසත්‍ය තොරතුරු ලබා දීම සහ තම රාජකාරිය නිසි පරිදි ඉටු නොකිරීම මගින් පොලිස් දෙපාර්තමේන්තුවට අගෞරවයක් සිදුකිරීම යන කරුණු මත සහකාර පොලිස් අධිකාරි එල්.ජී. සෙනවිරත්න විසින් උප පොලිස් පරීක්ෂක ජයතිස්ස බණ්ඩා සහ පොලිස් කොස්තාපල් 73344 සිරිවර්ධන යන නිලධාරින්ට විරුද්ධව 2014.08.21 දින විනය ක්‍රියා මාර්ග ගෙන ඇත.

නිරීක්ෂණ=:

01. මෙම ගැටළුව පුද්ගලික පාර්ශවයන් දෙදෙනෙක් අතර ඇතිවූ බව නිරීක්ෂණය වේ. මෙහිදී නැගෙන ගැටළුව වන්නේ, මෙම ආරවුල සමථයකට පත් කිරීමේදී වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු පීඩාවට පත්කර නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇද්ද යන්නයි.

02. කඩවත පොලිස් ස්ථානාධිපති කොමිෂන් සභාවට ලබා දුන් 2014.09.09 දිනැති අංක ඔඩබ්/1204/2014 යන ලේඛනයට අනුව වෛද්‍ය ප්‍රනාන්දු යන අය විසින් කඩවත පොලිස් ස්ථානයට සිදුකළ පැමිණිලි 2014.05.19 දින ප.ව 8.40 ට සී.අයි.බී. (II) 159/223 යටතේ වාර්තා වී ඇත.

03. කඩවත පොලිස් ස්ථානාධිපති විසින් කොමිෂන් සභාවට 2015.03 26 දින ලබා දුන් අංක කේඩී /ඔඩී/567/2015 යන ලේඛන වල පොලිස් වාර්තා වල උධෘත ඇතුළත් කර ඇත.

(i) ලේඛනයේ 04 වන පරිච්ඡේදයට අනුව පැමිණිලිකරු 2014.05.19 දින පස්වරු.5.40 ට අත්අඩංගුවට ගෙන බී 7096/13 යටතේ රඳවා තබා ඇති බව 2014.05.19 දින රඳවා තැබීම ලියාපදිංචි ලේඛනයේ සඳහන්ව ඇත.

(ii) ලේඛනයේ පස්වන ඡේදයට අනුව නිලධාරීන් පැමිණීම සහ පිටත්වීම දැක්වෙන දෛනික තොරතුරු පොතෙහි සඳහන් කර ඇති අතර, ඒ අනුව විශේෂ විමර්ශන ඒකකයට සහාය වීම සඳහා එදින කිසිදු කාන්තා උප පොලිස් පරීක්ෂකවරියක් නිදහස් කර නොමැත.

04. ඉහත (i) නිරීක්ෂණයට අනුව, වෛද්‍ය ප්‍රනාන්දු යන අයගේ පැමිණිල්ල (කඩවත පොලිස් ස්ථානාධිපතිගේ) 2014.09.09 දිනැති උධෘත අනුව වාර්තා වී ඇත්තේ 2014.05.19 දින පස්වරු 8.40ට වේ. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම වෛද්‍ය ප්‍රනාන්දු යන අයගේ

පැමිණිල්ල ප්‍රකාරව සිදුවීමට ඉඩකඩ නොමැති අතර. එයට හේතුව වන්නේ පැමිණිලිකරු අත්අඩංගුවට ගත් වේලාව පස්වරු 5.40 ලෙස රදවා ගැනිමේ ලේඛනයේ සඳහන් වී තිබීමයි. පැලියගොඩ විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ පො.කො.66723 නිලධාරියාගේ උධෘත අනුව 2014.05.19 දින ඔවුන් පොලිස් ස්ථානයට නැවත පැමිණිමෙන් පසු වරෙන්තුව මත පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත. කෙසේ වෙතත් මෙම කරුණ කොමිෂන් සභාවට ලබා දුන් කිසිදු ලේඛනයක සටහන් වී නොමැත.

05. ඉහත (ii) නිරීක්ෂණයට අනුව. පැලියගොඩ විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ පො.කො.6072 නිලධාරිගේ උධෘත පරිදි පැමිණිලිකරු යන අය විසින් ඔවුන් වෛද්‍ය ප්‍රනාන්දු මහර නගරයේ හමුවූබව සනාථ වේ. තවද රේණුකා ප්‍රියංගනි යන සැකකාරිය අත්අඩංගුවට ගැනිමට සහාය වීම සඳහා කඩවත පොලිස් ස්ථානයේ කාන්තා පොලිස් නිලධාරිනියක් සම්බන්ධ වූ බවද සඳහන් වේ.

06. වෛද්‍ය ප්‍රනාන්දුගේ පැමිණිල්ලට පිළිතුරු වශයෙන් පැමිණිලිකරුගේ ප්‍රකාශය බී7056/2013 යටතේ අධිකරණය ඉදිරියේ පෙනී නොසිටීම නිසා පොලිස් රුඳවුම්භාරයේ සිටින අවස්ථාවේ 2014.05.19 දින පස්වරු 11.30ට සටහන් කර ඇත.

07. පැමිණිලිකරු පොලිස් භාරයේ රඳවාගෙන සිටි නිසා වෛද්‍ය ප්‍රනාන්දුගේ පැමිණිල්ල පිළිබඳ විමර්ශනය කිරිමකින් තොරව අධිකරණයට ඉදිරිපත් කර ඇති බව පැහැදිලි වේ. ඒ හේතුවෙන් පැමිණිලිකරුට නිතියේ ඉදිරියේ සර්ව සාධාරණ සැලකීම අහිමි කර ඇති බව පෙනී යයි.

08. වෛද්‍ය පී.ටී.ඩී. ප්‍රනාන්දු යන අය පෙත්සමක් මගින් කඩවත පොලිසිය තම පැමිණිල්ල නිසි ආකාරයෙන් විමර්ශනය කර නොමැති බව 2014.08.15 දින පොලිස්පතිවරයාට දන්වා ඇත.

09. කැලණිය දිසාව භාර සහකාර පොලිස් අධිකාරි එල්.ඒ. සෙනවිරත්න විසින් ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හට 2014.09.02 දිනැතිව යොමු කරන ලද ලිපියේ සඳහන් පරිදි තම විමර්ශනය මගින් වෛද්‍ය පී.ටී.ඩී.චන්ද්‍රා ප්‍රනාන්දු පැමිණිලිකරුට එරෙහිව සිදුකර ඇති තර්ජණය කිරිම සහ දේපලට බලහත්කාරයෙන් ඇතුල්වීම යන චෝදනා සාවද්‍ය බව නිරීක්ෂණය වේ.

10. මෙම ලිපිය ප්‍රකාරව උ.පො.ප. ජයතිස්ස බණ්ඩාර සහ පොලිස් කොස්තාපල් 73344 සිරිවර්ධන යන නිලධාරින් ඒඑස්පි/කේඒඑල්/4095/14 යටතේ2014.08.21 දින සිට බල පැවැත්වෙන පරිදි නිසි විමර්ශනයකින් තොරව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනිම. දින 21ක්

බන්ධනාගාර ගත කිරීමට සැලැස්වීම, අධිකරණයට අසත්‍ය තොරතුරු සැපයීම, රාජකාරි නිසි අයුරින් ඉටු නොකිරීම, ආදි කරුණු මගින් පොලිස් දෙපාර්තමේන්තුවට අගෞරව කිරීම යන චෝදනා යටතේ රාජකාරි තහනම් කර ඇත.

11. ඒ අනුව 04 වන වගඋත්තරකරු විසින් ඉහත 13 වන ඡේදයේ ඉදිරිපත් කරන ලද චිත්ති වාචකය කොමිෂන් සභාව පිළිගොගන්නා අතර 02 වන වගඋත්තරකරු 2015.11.09 දින පැවති විමර්ශනයේ ඉදිරිපත් කළ කරුණු ප්‍රකාරව මෙම පැමිණිල්ලෙන් නිදහස් කර ඇත.

නිගමනය =:

මෙම තත්වය තුළ 01 වන 03 වන සහ 04 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන ආකාරයට කටයුතු කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

ඒ අනුව,

(අ) 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11(උ) වගන්තිය ප්‍රකාරව 01 වන, 03 වන සහ 04 වන වගඋත්තරකරුවන් එක් වගඋත්තරකරුවෙක් රු.10,000/- බැගින් පැමිණිලිකරුට රු. 30,000/-ක වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

(ආ) 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(3) (ඇ) වගන්තිය ප්‍රකාරව මෙම නිර්දේශය පොලිස්පතිවරයාට යොමු කරන අතර, නීති විරෝධි අත්අඩංගුවට ගැනීම හේතුවෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට හේතු සාධක වූ ක්‍රියා පටිපාටිය පිළිබඳ විමර්ශනයක් කර නිසි පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

2019.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :

01. ලේකම්.
ආරක්ෂක අමාත්‍යාංශය.
අංක 15/5. බාලදක්ෂ මාවත. කොළඹ 03

02. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

සැ.යු –: අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/nidarshani